# පුස්තකාල ප්‍රවෘත්ති

ශ්‍රී ලංකා ජාතික
පුස්තකාල සේවා මණ්ඩලයේ
ප්‍රවෘත්ති ප්‍රකාශනය

10 වන කලාපය 1/2 | 1989 ජනවාරි - ජූනි



වාර්ෂික දායක මුදල රු. 20/- | මිල රු. 10/-

# පුස්තකාල ප්‍රවෘත්ති

# நூலகச் செய்தி

# LIBRARY NEWS


1989
ජනවාරි - ජූනි
10 වන කලාපය 1/2



ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රකාශනයකි.



SL 2568


සාම්ප්‍රදායික අධ්‍යාපන රටාවේ කේන්ද්‍රස්ථානය ගමේ පන්සල විය. පන්සලේ අධ්‍යාපන ක්‍රමය තුළ උගැනීම සහ ඉගැන්වීම පිළිබඳ එයටම ආවේණික රටාවක් තිබිණ. නම්පොත, සකස්කඩ ආදී කොටගත් සන්න, ශතක, සැහැලි, කවි පොත් වනපොත් කිරීම සහ වැලිපිල්ලේ ලිවීම සුවිශේෂ ලක්ෂණ විය. සමතල පෘෂ්ඨයක් සහිත ගල්තලාවක් මත සිනිඳු වැලි අතුරා ඒ මත ඇඟිලි තුඩින් හෝඩිය ලිවීමේදී "අයනු කී අයන්නේ..." ආදී වශයෙන් සැහැල්ලක් කියමින් ලිවීමට ඉගැන්වීම සිරිත විය. මාතලේ අළුවිහාරයේ වැලිපිල්ල මත හිමිනමක් දරුවකුට අකුරු කර වූ අයුරු හේමන්ත අරුණසිරි නම් වූ ඡායාරූප ශිල්පියාගේ ඇස ගැසුණේ මෙලෙසිනි.

## පටුන


1. වෙනස්වන යුගයක ජාතික පුස්තකාල

2. THE PROVINCIAL COUNCILS SYSTEM & THE FUTURE ORGANISATION OF LIBRARY SERVICES IN SRI LANKA

3. ශ්‍රී ලංකාවේ දෙපාර්තමේන්තු පුස්තකාල පිළිබඳ හැඳින්වීමක්

4. NEW DAWN IN LIBRARY AUTOMATION

# වෙනස් වන යුගයක ජාතික පුස්තකාල

## මොරිස් බී. ලයින් ගේ 'NATIONAL LIBRARIES IN A TIME OF CHANGE' ලිපියේ පරිවර්තනයකි.

**මොරිස් බී. ලයින්**
බ්‍රිතාන්‍ය පුස්තකාලය (විද්‍යා තාක්ෂණ හා කර්මාන්ත ප්‍රලේඛන)
සැපයුම් මධ්‍යස්ථානය

අනුවාදය: **පියදස රණසිංහ**
සහකාර පුස්තකාලයාධිකාරී,
කැළණිය විශ්ව විද්‍යාලය

ජාතික පුස්තකාල වනාහි දශක කීපයක් මුළුල්ලේ තිබුණු සාකච්ඡාවලට පදනම් වූ මාතෘකාව කි. එහෙත් ඒවා පිළිබඳව කිසියම් සැබෑ ප්‍රගතියක් ඇති වී තිබේ නම් ඒ ඉතා මඳ වශයෙනි. ඌන සංවර්ධිත රට වල දී එක්කෝ ජාතික පුස්තකාල බිහි කොට නැත. නැත්නම් ඒවාට මහත් සේ බාධක පනවා තිබේ. මේ අතර දියුණු රටවල ජාතික පුස්තකාල වලට ඉහළ යන පිරිවැයට මුහුණ දීම අසීරු වී ඇත. ඒවායේ දී එකතු කළ යුතු, ආවරණය කළ යුතු ද්‍රව්‍ය සංඛ්‍යාව විශාලය. අනෙක් අතට එසේ රාශිගත කළ ද්‍රව්‍ය සංරක්ෂණය ද කළ යුතුව පවතී. රාජ්‍ය චින්තනයේ වෙනස්කම් මෙන්ම පෞද්ගලික විඥාපන අංශයේ වර්ධනය ද ඒවාට අභියෝග යක් වී ඇත.

මේ සමඟ ජාතික පුස්තකාල වලට නව අවස්ථා උදා වී ඇත. සිය එකතු වලින් අර්ථවත් සේවාවන් සැපයීමද, එමගින් සමහර විට මුදල් ඉපයීම ද ආදී වශයෙනි. එහෙත් මෙහිලා ද දුෂ්කරතා පවතී. මානව ශාස්ත්‍ර විෂයයෙහි ලා ජාතික පුස්තකාල වල පවත්නා සම්ප්‍රදායික පක්ෂපාතිත්වය පිළිබඳව ප්‍රශ්න නැගීම් අවශ්‍ය විය හැකි ය. ඒකීය ජාතික පුස්තකාලයක් සඳහා වන විකල්ප ගැන ඇතැම් සංවර්ධනය වන රටවල විවෘතව ම සාකච්ඡා කෙරේ. ජාතික පුස්තකාල කටයුතු හා ඒවා වඩා හොඳින් ඉටු කළ හැක්කේ කෙසේද යන්න අනුව සිතා බැලීම ප්‍රයෝජනවත් විය හැකියි. ස්වකීය ගැටලු හා අභියෝග වලට ජාතික පුස්තකාල නො බියව මුහුණ දිය යුතුය.

ජාතික පුස්තකාල ගත වූ විසි තිස් වසර තුල බෙහෙවින් සාකච්ඡා වට භාජනය වූ මාතෘකාවකි. ඒවායේ ස්වභාවය හා කාර්යයන් ගැන ලිපි ලේඛන ගණනාවක් ලියැවී ඇති වා පමණක් නොව ප්‍රධාන සම්මන්ත්‍රණ කීපයක් ද පැවැත් වී තිබේ. මින් සමහරක් විශ්ව ව්‍යාපී නියෝජනයක් සහිත ඒවා ය. සමහරක් ලෝකයේ ඇතැම් විශේෂිත කලාප වලට පමණක් සීමා විය. ජාතික පුස්තකාල වැදගත් වන්නේ පුස් තකාලයාධිපතීන්ට පමණක් නොවේ. ජාතික වැදගත් කමක් ඇති ආයතන ලෙස නැතහොත් ජාතික සංකේත ලෙස ඒවා දේශපාලඥයන්ට ද වැදගත් වේ. ජාතික පුස්තකාල පිළිබඳව හටගත් සංවාදයේ ප්‍රතිඵලයක් ලෙස ඒවායේ කාර්ය භාරය හා කටයුතු පිළිබඳ ව ඒක මතික භාවයක් සැහෙන තරම් දුරකට ඇති වී තිබෙන අතර ජාතික පුස්තකාලයක් විරහිත ව කිසිදු රටක් පපූර්ණත්වයට පත් නොවේ ය යන්න පොදු පිළිගැනීම වී තිබේ.

සාකච්ඡා බෙහෙවින් සිදු වූ මේ වකවානුව තුළ දී කෙතෙක් දුරට ජාතික පුස්තකාල විෂයයෙහි සැබෑ දියුණුවක් ඇති වී තිබේද ? අප පළමු වෙන් ම මහාද්වීපය දෙස අවධානය යොමු කළ හොත් දෙවන ලෝක යුද්ධය අවසාන වන විට එහි වූයේ ජාතික පුස්තකාල අතලොස්සක් පමණක් බව පෙනී යයි. එවක් පටන් අප්‍රිකාවේ බිහි වී ඇත්තේ ද ජාතික පුස්තකාල එකක් හෝ දෙකක් පමණි. සමහර රටවල ජාතික ලේඛනාගාර ඇතත් ජාතික පුස්තකාල ඇත්තේ ඒවායින් කීපයක් පමණි. සමහර විට ජාතික පුස්තකාලයක් පිළිබඳව වඩාත් ප්‍රගතිශීලී සැලැස්මක් තිබුණේ අප්‍රිකාවේ ජනාකීර්ණම රටවන නයිජීරියාවේ විය හැකි ය. විශාල වශයෙන් පුළුල් බලතල සහිත ජාතික පුස්තකාලයක් ඇති කිරීමට එහි දී සැලසුම් කරන ලද අතර, ඇත්තෙන්ම 1964 දී එය පිහිටුවීම ද සිදු කරන ලදී. එහෙත් ගත වූ විසි වසර තුළ එය දියුණු වූයේ ඉතා සෙමිනි. ඉටු කිරීම පිණිස බලය ලබා දුන් ඇතැම් කාර්යයන් ද නිසි ලෙස ඉටු කිරීමට ඒ ජාතික පුස්තකාලය සමත් වී නැත.

අනෙකුත් අප්‍රිකානු රටවල ද ජාතික පුස්තකාලය ගැන මීට වසර 20 කට පෙර පැවති අදහස අද වෙනස් තත්ත්වයකින් පැවතිය හැකි ය. ජාතික පුස්තකාලය රටක අනිවාර්ය අංග යක් ලෙස එදා පිළි ගැනිණි. එහෙත් නුදුරු අනාගතයේ දී ප්‍රමාණවත් ජාතික පුස්තකාල පිහිටුවීම් සඳහා අවශ්‍ය අරමුදල් නො ලැබී යාමට ඇති ඉඩකඩ ගැන හඟින පුස්තකාල යාධිපතිවරුන්ගේ සැලකිල්ල වැඩි පුර යොමු වන්නේ ජාතික පුස්තකාලයක් කෙසේ විය යුතු ද යන්න ගැන නොව, එවැන් නක් රහිතව, එවැන්නක කාර්ය භාරයන් ඉටු කළ හැක්කේ කෙසේද යන්න ගැනය. එක් ලේඛකයෙක් මේ සඳහා විවිධ විකල්ප ක්‍රම අටකට වැඩි ගණනක් ඉදිරිපත් කරයි.

ප්‍රගතිය යන්නෙන් අදහස් කරන්නේ ජාතික පුස්තකාල පිහිටුවීම් නම් මෙම අඩු ප්‍රගතියට හේතුව ඉතා පැහැදිලි ය. බොහෝ අප්‍රිකානු රටවල් ආර්ථික, දේශගුණික, කෘෂිකාර් මික නැතහොත් දේශපාලනික ආදී බරපතල ප්‍රශ්න රාශි යකට මුහුණ පා සිටී. මෙබඳු තත්ත්වයක් යටතේ ඒ රටවල ආණ්ඩු, නිෂ්පාදනය, කෘෂි කර්මාන්තය හා දේශපාලන ස්ථාවර භාවය ආදිය කෙරෙහි ප්‍රමුඛතාවක් ලබා දීම පුදුමයට කරුණක් නො වේ. එම ආණ්ඩු අනාගත ආර්ථිකයේ ලා තොරතුරු වල වැදගත්කම් වචනයට පමණක් සීමා කිරීමට ඉඩ තිබේ. වහා අවධානය යොමු කළ යුතු ප්‍රශ්න ඒ ආණ්ඩු වලට තිබේ. ජාතික පුස්තකාල ඒ ගණයට නො වැටේ.

අප්‍රිකාව එක් අන්තයකි. අනෙක් අන්තය වන සංවර්ධිත ධනවාදී රටවල් ගත හොත් ඒවායේ දී ද ජාතික පුස්තකාල වලට මුහුණ දීමට සිදු වී ඇත්තේ සුබදායක කාලයකට නො වේ. මේ රටවලදී පුස්තකාල සේවාවේ වැදගත් කම බොහෝ කාලයක් තිස්සේ පිළිගෙන තිබේ. එහෙත් අද මේ හැම රටක්ම පුස්තකාල සේවාව විශාල පොදු සහනාධාරයක් දිගටම කැප කළ යුතු තරම් වටිනා එකක් ලෙස අවිවාදයෙන් පිළි නො ගනී. මූර්ත වශයෙන් ගෙන බලන විට මේ රටවල ආණ්ඩු ජාතික පුස්තකාල වලට අරමුදල් සැපයීම අඩු කර ඇත. මීට එක් හේතුවක් නම් බොහෝ බටහිර ආණ්ඩු වල චින්තනයේ පෙරළිකාර වෙනස් වීමයි. ආර්ථික සම්පත් ලෙස තොරතුරුවල වැදගත්කම මේ ආණ්ඩු පිළි ගනී. එහෙත් ඒ වානේ කර්මාන්තය හෝ රෙදි පිළි කර්මාන්තය ආර්ථික සම්පතක් වන පරිද්දෙන් මය. අනෙකුත් සම්පත් පරිද්දෙන් ම තොරතුරු ද සිය දිවි පැවැත්ම තමා ම සලසා ගත යුතුය. එක්සත් ජනපදය වැනි රටවල වාණිජ තොරතුරු පිළිබඳ උනන්දුවක් බෙහෙවින් ප්‍රබල ය. එම උනන්දුව පුස්තකාල වල ඇතැම් සම්ප්‍රදායික කාර්ය භාරයන්ට පැහැදිලි වම තර්ජනයක් වී තිබේ. තොරතුරු සේවා, දත්ත පදනම් ආදිය ගැන දැන් පෙර නුවූ විරූ අවධාරණයක් තිබේ.

එදා මේ කටයුතුවලට නිතරම පාහේ පදනම් වූ මූලික සම්පත වූයේ ප්‍රකාශන යි. දැන් ඒ සම්පත කෙරෙහි එතරම් අවධානයක් යොමු නො වේ. බොහෝ රටවල ඇති ජාතික පුස්තකාල මූලික වශයෙන් ම සම්පත් මිස සේවා නො වේ. එහෙයින් ඒවා අන්තරායකාරී තත්ත්වයකට මුහුණ පා සිටීම් පුදුමයට කරුණක් නො වේ. ඇතැම් රටවල දී ඒවායේ පැවැත්මේ සාධාරණතාව පිරිවැය සාඵලයතා (Cost Affectiveness වශයෙන් තීරණය කරන්නට පළමු වරට සිදු වී තිබේ. ජාතික පුස්තකාලය විශාල වන තරමට, කැපී පෙනෙන තරමට ඒ කෙරෙහි එල්ල වන බලපෑම ද අධික වේ.

ඇත්තෙන් ම ''පරමාදර්ශී'' ජාතික පුස්තකාලයක් යනු කුමක් දැයි වටහා ගන්නට සමත් වී සිටින්නේ රටවල් අත ලොස්සක් පමණි. විකල්පයන් කීපයක් අතුරින් එකක් ඒවා විසින් ගලපා ගනු ලැබීමට ඉඩ තිබේ. සම්ප්‍රදායික ජාතික පුස්තකාලය පිළිබඳ අදහසින් මුළු මිනින් ම ඉවත් වී, විශාල ක්ෂේත්‍රයක පැතිරී යන කාර්යයන් සමූහයක්, ඒවා සාමාන්‍ය යෙන් ඉටු කිරීමට අපේක්ෂිත ආකාරයෙන් නොව වෙනත් ආකාරයකින් සපුරා ලන ලිහිල්ව ගිය හෙවත් දියව ගිය ජාතික පුස්තකාල ස්වරූපයක් මේ රටවල් විසින් අනුගමනය කිරීමට පිළිවන. තවත් විකල්පයක් නම් කාර්යභාරයන් ගේ ප්‍රමාණය අඩු කොට ඉන් එකක් හෝ දෙකක් ඉතා හොඳින් ඉටු කිරීමයි. තෙවැනි ප්‍රධාන විකල්පය වන්නේ රජයේ අරමුදල් වලට අතිරේකව පුද්ගලික අංශය හා ඒකාබද්ධව කටයුතු කිරීමෙන් මුදල් උපයා ගෙන එමගින් ස්වකීය කාර්ය භාරයන් ගඩත්තු කිරීමයි. කාර්යභාරයන් වැඩි කිරීමට පවා මේ මගින් පිළිවන.

සමතුලිත වශයෙන් අරමුදල් ලැබෙන කල්හි පවා ජාතික පුස්තකාල වලට බරපතල අභියෝගයන්ට මුහුණ පෑමට සිදු වනු ඇත. ප්‍රකාශිත ද්‍රව්‍ය වල මිල ඉහළ යන්නේ සාමාන්‍ය උද්ධමන මට්ටමට වඩා වැඩි වේගයකිනි. එපමණක් නොව වාර්ෂිකව නිකුත් වන ප්‍රකාශන සංඛ්‍යාව ද ශීඝ්‍රයෙන් ඉහළ යයි. මේ නිසා ඒවා අයත් කර ගැනීමේ වත්මන් මට්ටම

---

**සැබවින් ම බ්‍රිතාන්‍ය පුස්තකාලය ඇතුළු ඇතැම් ජාතික පුස්තකාල ගමන් කරන මාර්ගයෙහි ඒට ම ආවේනික ආපදා නැත්තේ නොවේ. එහෙත් මේ ආපදා අඩු තරමින් සිත් ගන්නා සුළු ය. අභියෝගාත්මක ය. ඒවා සෝදා පාලුව හා දියවීයාම පිළිබඳ ආපදාවට වඩා අවම මට්ටමක පවතින ඒවා ය. (මම එය සහතික කොට කියමි.) ඒ මාර්ගයෙහි ගමන් නොකරන ලද්දේ නම් සෝදා පාළුව හා දියවී යාම අපේ ඉරණම වනු ඇත. බලාපොරොත්තු සහ ගතව ගමන් කිරීම ගෙදරට වී බලා සිටීමට වඩා හොඳය.**

---

එසේ ම පවත්වා ගෙන යාමට නම් හැම වසරකම මූර්ත වශයෙන් වැඩි අරමුදල් ප්‍රමාණයක් ජාතික පුස්තකාල වලට අවශ්‍ය වේ. මීට අතිරේකව ප්‍රකාශන ද්‍රව්‍යවල ක්ෂේත්‍රය ද නිතිපතා විශාල වශයෙන් පුළුල් වෙයි. මීට විසි තිස් වසරකට පෙර ප්‍රකාශිත ද්‍රව්‍ය වලින් වැඩි ප්‍රමාණයක් පැවතුණේ මුද්‍රිත ස්වරූපයෙනි. අද අප ප්‍රකාශිත සාහිත්‍යයේ (Grey Literature) අනුපාතය ක්‍රමයෙන් වර්ධනය වී ඇති අතර ශබ්ද වාර්තා, වීඩියෝ වාර්තා, ආදී වශයෙන් වන නොයෙකුත් ග්‍රන්ථමය නොවන ශ්‍රව්‍ය දෘශ්‍ය ස්වරූප ශීඝ්‍රයෙන් වැඩි වී තිබේ. කිසි කලෙක මුද්‍රිත පිටු වශයෙන් ප්‍රකාශයට පත් නොවන ඉලෙක්ට්‍රොනික් ස්වරූපයෙන් පමණක් කළ එළි බසින ප්‍රකාශන හා පරිගණක වැඩ සටහන් ද මේ ගණයට අයත්වේ.

විවිධ රටවල දී නොයෙකුත් අමුද්‍රිත ද්‍රව්‍ය නීතිමය තැන්පතු වලට අයත් වේ. සමහර රටවල දී එසේ අයත් නොවේ. ඇතැම් රටවල දී ඒවා රැස් කිරීම ජාතික පුස්තකාලයේ නොව තවත් ආයතනයක වගකීමක් වෙයි. එම ආයතනය සමහර විට ජාතික ශබ්ද හා දෘශ්‍ය ලේඛනාගාරයක් විය හැකි යි. සමහර රටවල මෙබඳු ආයතනයක් කොහෙත්ම නොතිබීමට පිළිවන. විශේෂයෙන් ම ඒවා නීත්‍යානුකූල තැන්පතු යටතට නො ගැනෙන කල්හි එබඳු ද්‍රව්‍ය එකතු කිරීමේ ගැටලුව හැරෙන්නට ලබා ගැනීම පිළිබඳ ව ද ප්‍රශ්න මතු වේ. භාවිත කිරීම සඳහා ඇතැම් යන්ත්‍ර සූත්‍ර අවශ්‍ය වීම මෙවා යේ පොදු ලක්ෂණයක් වන බැවිනි. ප්‍රමිත හා ස්ථිර නිමාවන් කීපයක් පමණක් වේ නම් මෙය ගැටලුවක් නො වනු ඇත. එසේ නම් අවශ්‍ය වන්නේ එකිනෙකට වෙනස් යන්ත්‍ර කීපයක් පමණි. එහෙත් තත්ත්වය මීට හාත් පසින් ම වෙනස් ය. නිමාවන් විශාල සංඛ්‍යාවක් ඇතිවා පමණක් නොව ඒවා නිතරම වෙනස් වීම ද සිදු වේ. එහෙයින් එක් විශේෂිත රටාවකින් ප්‍රකාශිත දෑ අදාළ යන්ත්‍ර සූත්‍ර යල් පැන ගිය විට, ඉබේම වසර දෙක තුනක දී යල් පැන ගිය තත්ත්වයට පත් විය හැකියි. ඒවා වෙනත් නිමාවකට පෙරළා ගත හොත් මිස – මෙය බොහෝ විට අපහසුය - වියදම් සහිතය. පුස්තකාලයට හෝ ලේඛනාගාරයකට යන්ත්‍ර සූත්‍ර විශාල සංඛ්‍යාවක් රැස් කිරීමට හා නඩත්තු කිරීමට සිදු වේ. මින් සමහරක් යල් පැන ගිය ඒවා විය හැකියි. එතකුදු වුවත් ඒ සියල්ල ක්‍රියාත්මක තත්ත්වයෙන් පවත්වා ගත යුතු යි.

මෙබඳු ද්‍රව්‍ය ජාතික වශයෙන් රැස් කළ යුතු ද නැද්ද යන ප්‍රශ්නය ජාතික පුස්තකාලයකට මඟ හැර සිටිය හැක්කක් නො වේ. දැනට ඒ වගකීම නැතත්, එබඳු වගකීමක් මතුවට දැරීමේ අදහසක් නැතත් එම ද්‍රව්‍ය කවරාකාරයෙන් හෝ රාශිගතවන බව සහතික කිරීම සම්බන්ධව කිසියම් වගකීමක් සැබවින් ම ජාතික පුස්තකාලය සතු වේ. මක්නිසාද යත් ඒවා ජාතික සංස්කෘතියේ හා උරුමයේ කොටසක් වන බැවිනි. මුද්‍රිත ද්‍රව්‍ය වල පරිද්දෙන් ම ඒවායේ ඇති තොරතුරුමය වටිනාකම් ගැන ද අමුතුවෙන් කිය යුතු නොවේ. බ්‍රිතාන්‍යයේ දී නම් මෙබඳු ද්‍රව්‍ය රැස් කිරීමට සම්බන්ධ ප්‍රධාන ආයතනවල ජ්‍යෙෂ්ඨ පුද්ගලයන් සුලු ගණනක් එක් කොට ගෙන, ඒ ද්‍රව්‍ය සමස්ත වශයෙන් රාශිගත කිරීම සහතික කිරීමට හා එහිලා ප්‍රයත්නයක් දැරීමට බ්‍රිතාන්‍ය පුස්තකාලය පෙරමුණ ගෙන සිටී. බ්‍රිතාන්‍ය පුස්තකාලයට පැවරී ඇති වගකීම වන්නේ මුද්‍රිත ද්‍රව්‍ය හා ශබ්ද වාර්තා පමණක් රැස් කිරීම ය. මින් දෙවැන්න (අනෙකුත් අමුද්‍රිත ද්‍රව්‍ය මෙන්ම) නීත්‍යානුකූල තැන්පතුවට අයත් නො වේ.

ජාතියේ ප්‍රකාශන සියල්ල රැස් කිරීම් ජාතික පුස්තකාල යට අයත් එක් සම්ප්‍රදායික මෙන් ම පිළිගත් කාර්යයක්ද වේ. ඒවා සංරක්ෂණය කිරීම තවෙකකි. තම එකතු දිරා පත් වීමේ ප්‍රමාණය හා අනුපාතය ගැන පුස්තකාලයාධිපතීන් අවධානය යොමු කරන්නට පටන් ගත්තේ ගත වූ දශකයේ දී පමණ පටන් ය. සතුටුදායක තත්ත්වයක් යටතේ සමස්ත එකතුවක් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය වන සම්පත් ප්‍රමාණය අති විශාලය. සමහර විට කොන්ග්‍රස් පුස්තකාලය හැරෙන්නට අන් කිසි පුස්තකාලයකට එම සම්පත් ලබා ගැනීම කළ නො හැකි වනු ඇත. සමහර ඒවායේ නෛසර්ගික ස්වරූප වලින් ආරක්ෂා කළත්, නැත හොත් සූක්ෂම ස්වරූප නැතහොත් අංකන ස්වරූප (Digital Forns) වැනි වෙනත් ස්වරූපයකට පෙරළා ආරක්ෂා කළත් මෙහි ලා ඉක්මන් හෝ පහසු විසඳුම් නැත. වෙනත් ස්වරූපයකට පෙරළීමේ ඇති වාසිය නම් වරක් පිළියෙළ කරන ලද පිටපත අනෙකුත් ජාතික පුස්තකාල වලට ද ලබා ගත හැකි වීම යි. (ඇත්තෙන් ම් අනෙකුත් පුස්තකාල වලට ද ) මෙ මඟින් ශ්‍රමය හා වියදම් රටවල් අතර බෙදා ගත හැකිය.

වෙනත් ස්වරූප වලට පෙරළිය යුතු වන්නේ මුද්‍රිත ද්‍රව්‍ය පමණක් නො වේ. ග්‍රන්ථමය නොවන ද්‍රව්‍ය හා ඉලෙක් ට්‍රොනික ප්‍රකාශන ද ඊට අයත් ය. මේ නිසා සුවිශේෂ ප්‍රශ්න හට ගනී. ග්‍රන්ථමය නොවන දෑ වලට සම්බන්ධ ව මේවායින් ඇතැම් වර්ග ගැන ඉහතින් සඳහන් කරන ලදී. ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ ප්‍රකාශන පහසුවෙන් නිරන්තර සංස්කරණයට භාජනය කළ හැකිය. සැබවින් ම මෙය ඒවා යේ ඇති එක් වාසියකි. එවැන්නකින් පිටපතක් ජාතික පුස්තකාලයක තැබිය යුතු නම් තැන්පත් කළ යුත්තේ කුමන සංස්කරණය හෝ සංස්කරණ ද ?

ජාතියේ ප්‍රකාශන පුළුල් වශයෙන් රැස් කිරීම හා සංරක්ෂණය කිරීම පිළිබඳ සිය සාම්ප්‍රදායික කාර්යයන් ඉටු කරන්නට නම් ජාතික පුස්තකාල වලට අති මහත් සම්පත් රාශියක් උවමනා වේ. එහෙත් පුස්තකාල එකකට හෝ දෙකකට වඩා ඒවා සපයා ගැනීමට සමත් වේ යැයි සිතිය නොහේ. මෙබඳු ප්‍රශ්න ප්‍රකාශිත ද්‍රව්‍ය විශාල වශයෙන් බිහිවන රටවලට පමණක් සීමා නො වේ. අප්‍රිකාව නිදසුනක් ලෙස ගත හොත් එහි ඓතිහාසික සංස්කෘතිය මෙන් ම වත් මන් සංස්කෘතිය ද බොහෝ දුරට වාචික ය. ලිඛිත නොවේ. එහෙත් මතු පරපුර සඳහා එම සංස්කෘතිය වාර්තා ගත කිරීමේ වගකීමක් පවතින බොහෝ රටවල් සීඝ්‍ර සමාජ විපරිණාම යකට භාජනය වන බැවින් මේ තත්ත්වය තවත් උග්‍ර වේ. බොහෝ දියුණු ධනවාදී රටවල් හා සසඳන විට මේ රටවල ප්‍රකාශිත ග්‍රන්ථ සංඛ්‍යාව අල්ප වෙතත් ඒවායේ නීතිමය තැන්පතුව සහතික කිරීම නැතහොත් වෙනත් අයුරින් ඒව රාශිගත කිරීම පිළිබඳ ප්‍රශ්න බරපතලය. එසේම සර්ම කලාපීය හා උප සර්ම කලාපීය දේශගුණික තත්ත්වයන් යටතේ ඒවා සංරක්ෂණය කිරීම ද වඩා දුෂ්කර වෙයි.

ජාතික පුස්තකාල වල තෙ වැනි සාම්ප්‍රදායික කර්තව්‍යය නම් ජාතික වශයෙන් නිෂ්පාදිත ප්‍රකාශන ද්‍රව්‍ය සියල්ල ම වාර්තා ගත කිරීම ය. ඇතැම් රටවල දී මීට වසර කීපයකට පෙර පාලනය කර ගත හැකි මට්ටමක තිබූ මෙම කාර්යය, අද ප්‍රකාශන බාහුල්‍යය නිසා මහත් බරක් බවට පත් වී තිබේ. මුද්‍රිත ද්‍රව්‍ය හැරෙන්නට වෙනත් ප්‍රකාශන ස්වරූප ද ඇතුළත් වන පරිදි ජාතික ග්‍රන්ථ නාමාවලී සේවාව ව්‍යාප්ත කිරීම මීට එක් හේතුවක් විය හැකි ය. ග්‍රන්ථ නාමාවලී කාර්යය වෙනත් ද්‍රව්‍ය ද ඇතුළත් වන පරිදි ව්‍යාප්ත කළ විට, එම වාර්තා වෙනත් පුස්තකාල වලට විකිණීම මඟින් ඒ සඳහා වන පිරිවැය පියවා ගත හැකි යැයි අපේක්ෂා කළා විය හැකියි. එහෙත් හැම විටම එසේ සිදු වී නැත. දැනට පවත්නා වාර්තා ප්‍රයෝජනයට ගත හැකි දත්ත පදනමක් බවට පෙරළා ගැනීම ලෙහෙසි කටයුත්තක් නො වේ. මේ සියලු ම කටයුතු සඳහා සම්පත් බහුල වශයෙන් අවශ්‍ය වේ.

සාම්ප්‍රදායික වගකීම් සපුරා ගන්නට යාමේ දී ජාතික පුස්තකාල වලට බරපතල ගැටළුවලට මුහුණ දීමට සිදු වීමත් සමඟම නව අවස්ථා ද උදා වී එයි. සාම්ප්‍රදායික වශයෙන් ජාතික පුස්තකාල, විමර්ශනය සඳහා ලබා ගත හැකි, ප්‍රකාශිත ද්‍රව්‍ය මධ්‍යස්ථාන විය. ඒවා වඩාත් පලදායී අයුරින් භාවිත කිරීමට එතරම් ඉඩක් නො විණි. ඡායා පිටපත්, බැහැරදීම් මඟින් හෝ, තොරතුරු සේවා මඟින් හෝ, ග්‍රන්ථ විද්‍යාත්මක දත්ත පදනම් මඟින් හෝ නැතහොත් එකතුවෙන් ලබා ගෙන පිරි සැකසූ තොරතුරු විශේෂිත අනුග්‍රාහක කණ්ඩායම් වලට සැපයීම මඟින් හෝ ප්‍රලේඛන සැපයීමේ ලා ප්‍රධාන කාර්ය භාරයක් ඉටු කරන්නේ ජාතික පුස්තකාල කීපයක් පමණි. ඇතැම් පුස්තකාල මේ අංශයේ ලා කිසියම් ප්‍රමාණයක් ඉදිරියට ගොස් ඇති අතර එබඳු සේවාවන් සඳහා ගාස්තු අය කිරීම් හානිකර පූර්වාදර්ශයක් වනු ඇතැයි යන අදහස මත ඊට ද විරුද්ධ වී සිටී. අනෙකුත් පුස්තකාල විසින් ගාස්තු අය කිරීම කළ හැකි වුවත්, එවැන්නක් අවසාන වශයෙන් කළ යුතු වන්නේ ජාතික පුස්තකාල විසින් ය යන හැඟීම ද මීට හේතු වක් විය හැකි ය. වියදම් මුළුමනින් ම නැතහොත් බොහෝ දුරට හෝ පියවා නො ගත හොත් එම සේවාවන් කොහෙත්ම ලබා දිය නො හැකි වනු ඇතැයි යන සාධාරණ හේතුව මත බ්‍රිතාන්‍ය පුස්තකාලය වැනි ඇතැම් ආයතන ගාස්තු අය කිරීම බාර ගෙන තිබේ. අඩු තරමින් පිළිගෙන හෝ තිබේ. සේවා වන් සඳහා ගාස්තු අය කරනු ලැබුවත් බොහෝ ජාතික පුස්ත කාල වලට ආදායමක් ඉපයිය නො හැකි ය. එනිසා ගාස්තු අය කිරීමේ එතරම් අර්ථයක් නැත. එහෙයින් ඒවා විසින් එක්කෝ ප්‍රාථමික සේවාවන් (ප්‍රාථමික යැයි කියන ලද්දේ

**අද අප ජීවත් වන්නේ විද්‍යාත්මක හා තාක්ෂණික සමාජයක ය. මෙය අපේ සංස් කෘතියයි. සැබවින් ම එය ජාතික එකතුව විසින් නියෝජනය කරනු ලැබිය යුතුයි. අවසාන වශයෙන් ගෙන බලන විට අද සමාජ විද්‍යාව බවට පත් වන්නේ ඊයේ කුණු කන්දල් ය. පෙරේද කුණු කන්දල් අද ඉතිහාසය බවට පත් වේ. සංස්කෘති යක් කුණු කන්දල් රැසක් බිහි කරන්නේ නම් එය එසේ වුවා දෙන්. ජාතික එකතු වෙන් පිළිබිඹු විය යුතුය. ජාතික කෞතු- කාගාරයක එදිනෙද බඩු බාහිරාදිය මෙන් ම වටිනා ද්‍රව්‍යද රැස් කර තැබෙන්නාක් මෙනි. මධ්‍යගත යුගයේ කසල ගොඩවල් හි මෙන් ම තුතන් කාමන් ගේ සොහොන් ගැබේ අඩු වැඩිය ද එහි තිබිය යුතු යි.**

විශාල කාර්ය මණ්ඩලයකින් තොරව ඒවා සැපයිය නො හැකි බැවිනි.) නොමිලේ සැපයීම හෝ සියලුම සේවාවන් නවත්වා දැමීම හෝ කළ යුතුය. එහෙත් මෙය ද ජාතික පුස්ත කාල විෂයයෙහි හානිකර තත්ත්වයක් උදා කළ හැකි යි. මන් ද යත් සම්පූර්ණ ප්‍රයෝජනය නො ගන්නේ නම් ඉතා විශාල හා මිල අධික සම්පත් සඳහා අරමුදල් සැපයීමට ආණ්ඩු අකමැති විය හැකි බැවිනි.

සියලුම ආණ්ඩු ජාතික පුස්තකාල පිළිබඳව පැහැදිලිව සිතන බවත් හෝ එකම ආකාරයෙන් කටයුතු කරන බවත් හෝ නො පෙනේ. ඉපයූ ආදායම් රඳවා ගැනීම බඳු කිසිදු අනුබලයක් නො දීම, ජාතික පුස්තකාල වඩාත් කාර්යක්ෂමව හා පිරිවැය කාර්යක්ෂමතාවෙන් යුතුව කටයුතු කිරීමක් ආණ්ඩුව විසින් අපේක්ෂා කරනු ලැබිය හැකිය. ජාතික පුස්තකාලය එසේ කටයුතු කරන විට ආණ්ඩු ඒවාට දෙන මුදල් ප්‍රමාණය අඩු කිරීමට ද ඉඩ තිබේ. අරමුදලේ අඩු කිරීම නිසා ඇතැම් හොඳ ප්‍රතිපල ලැබිය හැකි නමුත්, කිසියම් ආකාරයක අනුබල දීමක් ද අවශ්‍ය වේ. සිය අරමුණු අඩු වෙන් සාක්ෂාත් කර ගන්නා ජාතික පුස්තකාලයක් විසින් ඇතැම් තත්ත්වයන් යටතේ ආණ්ඩුවට දොස් නගනු ලැබීම ද සාධාරණ විය හැකි ය.

තම සීමාවන් තුළට කොටුව සිටින්නේ ද, නො එසේ නම් ඒවා ඉක්මවා යන්නේ ද යන උභතෝකෝටිකය (දෙවැන්න තෝරා ගත හොත් එය ප්‍රායෝගික වශයෙන් කරන්නේ කෙසේද යන්න) නුදුරු අනාගතයේ දී බොහෝ ජාතික පුස්තකාල වලට මුහුණ පෑමට සිදුවන ප්‍රශ්නයක් වනු ඇත. එක් පසකින් පවතින්නේ සාම්ප්‍රදායික කාර්යභාරයක් පවා සම්පූර්ණ ලෙස ඉටු කරන්නට අසමත් ප්‍රමාණවත් නොවන එකතුවකි. අනෙක් පසින් ඇත්තේ එකතුව මත පදනම් වූ ප්‍රවේග ශීලී සේවාවන් රාශියක් සැපයීමේ හැකි යාවකි. මෙම සේවාවන්ගෙන් උපයනු ලබන මුදල් වලින් ඒවායේ වියදම පියවීම පමණක් නොව එකතු නඩත්තු කිරීමෙහි ලා උපකාරී වීම ද කළ හැකියි. විකල්පයන් පිළිබඳ මේ නිර්භය ප්‍රකාශය මේ දෙපැත්තම සරල කාර්යයක් බවට පත් කරයි. විශේෂයෙන් එය ආදායම් රඳවා ගැනීමේ ප්‍රශ්නය හැරෙන්නට සංවර්ධනය වෙමින් පවතින තොරතුරු සේවා පිළිබඳ ප්‍රායෝගික ගැටලු වලට සම්බන්ධ නොවේ. නිදසුන් ලෙස ගත හොත් මහජන මුදලින් නඩත්තුවන ජාතික පුස්ත කාලයක් ඒ අයුරින් වාණිජ මට්ටමකට බැසීම සාධාරණද ? මේ සේවාවන් පෞද්ගලික අංශයේ සේවාවන් හා කිසියම් ආකාරයකින් තරඟ නො වදිනු ඇත්ද ? එසේ තරඟ කිරීමට ඉඩ හළහොත් තරඟය සාධාරණ හා සමාන කොන්දේසි මත සිදුවිය යුතු නො වේද ? එසේ නම් ඒවා තරඟයෙන් නො පරදිනු ඇත්ද ? ස්වකීය සියලුම සම්ප්‍රදායන් ද සමඟ සැබෑ හා තරඟකාරී සේවාවන් සැපයීම පිණිස නිවැරදි කාර්ය මණ්ඩලයක් සොයා ගන්නේ කොතනින් ද? මූලික සේවා වන් සඳහා අවශ්‍ය වන අතිරේක සම්පත් ලබා ගැනීමට මුදල් අය කිරීම සාධාරණ යයි සිතෙන මට්ටමට ඒ සේවා වන් ගෙනඒමට මුදල් ණයට ලබා ගැනීමට මහජන මුදලින් නඩත්තු වන ආයතනයක් අසමත් වන්නේ කෙසේද ? ජාතික ග්‍රන්ථ නාමාවලි වාර්තා ප්‍රයෝජනයට ගැනීම මගින් පවා තව වසර කීපයක දී ලාභ උපයා ගත හැකි වනු ඇත. එහෙත් පළමුව සම්පත් වැය කිරීමකින් තොරව එය ද සාක්ෂාත් කර ගත නො හැකි වනු ඇත.

මෙහිලා දිය හැකි එක් විසඳුමක් නම් ජාතික පුස්තකාලීය එකතු වලින් ප්‍රයෝජන ගැනීමට පෞද්ගලික අංශයට ඉඩ දීමය. මෙ මගින් ඔවුනට වාණිජමය තොරතුරු නිෂ්පාදන බිහි කළ හැකි වනු ඇත. අනෙක් අයට මෙන් ම පුද්ගලික ආයතනවලට ද ජාතික පුස්තකාල භාවිත කළ හැකි හෙයින් මෙය දැනට මත් කිසියම් ප්‍රමාණයකට සිදු වේ. එහෙත් බොහෝ ජාතික පුස්තකාල සම්පත් වලින් ලබා ගත හැකි ප්‍රයෝජන වලින් අංශු මාත්‍රයකට වඩා දැනට ලබා ගැනෙන්නේ යැයි කිව නොහේ. කිසියම් ආකාරයක ප්‍රති ලාභයකින් තොරව සිය සම්පත් වාණිජමය ප්‍රයෝජනයක් සඳහා පුද් ගලික ව්‍යවසායයන් එකකට හෝ කීපයකට ලබා දීම ජාතික පුස්තකාලයක් විෂයෙහි සැබවින් ම අර්ථවත් වේද ? යෝග්‍ය වේද ? ජාතික පුස්තකාල වාණිජ සංවිධාන සමඟ ගිවිසුම් වලට එළඹෙනු ඇත්ද ? නො එසේ නම් සිය සම්පත් ඔවුනට රිසි සේ භාවිත කිරීමට බලය ලබා දෙනු ඇත්ද ? මේවා අනුමානාත්මක ප්‍රශ්න නො වේ. දැනට ම ඇතැම් ජාතික පුස්ත කාල මේ ප්‍රශ්න වලට මුහුණ පා සිටී. මීට එක් හේතුවක් නම් ආණ්ඩු වල බල කිරීම ය. අනෙක් හේතුව වන්නේ ක්‍රම යෙන් සිදුවන සිය සෝද පාලුව සඳහා විකල්පයක් වශයෙන් වැඩි වැඩියෙන් ස්වයං උපකාරක ක්‍රමයක අවශ්‍යතාව ජාතික පුස්තකාල වලට ම වැටහී තිබීම යි.

මා සාකච්ඡා කරමින් සිටි ප්‍රශ්න ප්‍රධාන වශයෙන් ම අතිශය සංවර්ධිත ධනවාදී රටවලට බලපාන ඒවා ය. එහෙත් එම රටවල ප්‍රතිපත්ති කෙතරම් වක්‍රාකාරයෙන් හෝ ඌන සංවර්ධිත රටවල හා සමාජවාදී රටවල ජාතික පුස්තකාල වලට බල නො පාන්නේ යැයි සිතිය නො හේ. මේ බලපෑම් යහපත් වේද අයහපත් වේද යන්න අපේක්ෂා මාත්‍ර යක් පමණි. සැබවින් ම බ්‍රිතාන්‍ය පුස්තකාලය ඇතුළු ඇතැම් ජාතික පුස්තකාල ගමන් කරන මාර්ගයෙහි ඊට ම ආවේනික ආපදා නැත්තේ නො වේ. එහෙත් මේ ඇපද අඩු තරමින් සිත් ගන්නා සුළු ය. අභියෝගාත්මක ය. ඒවා සෝද පාලුව හා දියවී යාම පිළිබඳ ආපදාවට වඩා අවම මට් ටමක පවතින ඒවා ය. (මම එය සහතික කොට කියමි.) ඒ මාර්ගයෙහි ගමන් නො කරන ලද්දේ නම් සෝද පාලුව හා

දියවී යාම අපේ ඉරණම වනු ඇත. බලාපොරොත්තු සහගතව ගමන් කිරීම ගෙදරට වී බලා සිටීමට වඩා හොඳ ය.

සාකච්ඡා කළ යුතු තවත් ප්‍රධාන ප්‍රශ්නයක් තිබේ. ජාතික පුස්තකාල විෂය සාහිත්‍යයට අයත් බෙහෝ දෑ මම කියවා ඇත්තෙමි. එහෙත් ඒවා අතුරින් මේ ප්‍රශ්නය ගැන සඳහන් වන ලිපි ලේඛන හමු වූයේ ඉතාමත් අල්ප වශයෙනි. මේ ප්‍රශ්නය නම් විද්‍යාව හා තාක්ෂණය විෂයයෙහිලා ජාතික පුස්තකාල වල කාර්ය භාරයයි. මෙය තොරතුරු සේවා හා ඒවා උපයෝජනය පිළිබඳ ප්‍රශ්නයට සම්බන්ධ වේ. මන් ද යත් විද්‍යා හා තාක්ෂණික එකතු මේ සේවාවන් සඳහා වැඩි පුර ඉඩ කඩ සපයන බැවිනි. බෙහෝ රටවල දී ජාතික පුස්තකාල මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන් කෙරේ වැඩි පක්ෂපාතිත්වයක් දක්වන බව පෙනේ. මෙය කිසිසේත් පුදුමයට කරුණක් නො වේ. මහා ජාතික පුස්තකාල බිහි වූ වකවානුවේදී නිෂ්පාදිත ප්‍රකාශන වලින් වැඩි හරියක් මානව ශාස්ත්‍ර ක්ෂේත්‍රයට ද, ඉතිරිය සමාජ විද්‍යාවන්ට ද, අයත් විය. විද්‍යාව හා තාක්ෂණය පෙරට පැමිණියේ ප්‍රථම ලෝක සංග්‍රාමයේ පටන් ය. ජාතික පුස්තකාල සංස්ථාපිත පරිදි ඒවායින් සැපයීමට හැකි වූ විවිධාකාර සේවාවන් – එනම්, තොරතුරු සේවා, හොඳ ප්‍රලේඛන සැපයුම් සේවා අනුක්‍රමණිකා සහ සාර සංග්‍රහ සේවා ආදිය විද්‍යාඥයෝ හා තාක්ෂණිකඥයෝ ඉල්ලා සිටියහ. මේ නිසා බෙහෝ රටවල දී ජාතික පුස්තකාල වලින් පරිබාහිර අමාත්‍යාංශ යටතේ විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ ජාතික ප්‍රලේඛන මධ්‍යස්ථාන පැන නැගුණි. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා විෂයයන් කෙරේ පමණක් යොමු වූ අවධාරණයක් ඇති අඩු අරමුදල් සහිත ජාතික පුස්තකාලත් ඒ සමඟම විද්‍යාව හා තාක්ෂණය සඳහා තරමක් වෙනස් එහෙත් සම්බන්ධිත කාර්යයක් ඉටු කරන සාපේක්ෂ වශයෙන් යහපත් අරමුදල් සහිත ජාතික ප්‍රලේඛන මධ්‍යස්ථානත් බිහි වීම මෙහි ප්‍රතිඵලය විය. ප්‍රලේඛන මධ්‍යස්ථාන සතුව ප්‍රමාණවත් එකතු තිබීමට හෝ නො තිබීමට පිළිවන. බොහෝ රටවල විද්‍යා හා තාක්ෂණික ප්‍රකාශන පිළිබඳ නීතිමය තැන්පතු අයිතිය තාමත් ජාතික පුස්තකාල සතු වේ. මෙය බෙහෝ විට අපහසුදායක වුවත් එදිරිවාදාත්මක වූ සම්බන්ධතාවකට මඟ පාදයි. මෙහි නරක ම පැත්ත වන්නේ ප්‍රලේඛන මධ්‍යස්ථානයට තරම් බලවත් අනුග්‍රහයන් නැති නිසාත්, එබඳු ප්‍රබල අමාත්‍යාංශයක් නො මැති නිසාත් ජාතික පුස්තකාලය අතිශය පසු බෑමකට ලක් වීමයි.

මෙහි දී මතුවන ප්‍රශ්නය නම් මානව ශාස්ත්‍ර ක්ෂේත්‍රය පිළිබඳ අවශ්‍යතා විද්‍යා ක්ෂේත්‍රය පිළිබඳ අවශ්‍යතා වලට වඩා හාත්පසින් ම වෙනස් ද, ඒවා එකම ආයතනයකින් සපුරාලිය නො හැකි ද යන්න යි. ඇත්තෙන් ම එම අවශ්‍යතා එකම ආයතනයකින් සපුරා ලන්නට නම් බොහෝ ජාතික පුස්තකාල පෙරළිකාර වෙනසකට භාජනය විය යුතුය. මෙහිලා ඇති එක් හැකියාවක් නම් ජාතික පුස්තකාලය ප්‍රධාන අංශ දෙකකින් යුතුව සංවිධානය කිරීම යි. ඒවා එකිනෙකට ඉතා සමීපව කටයුතු කරන නමුදු ස්වකීය විවිධාකාර අනුග්‍රාහකයන්ට අනුව විවිධ ප්‍රමුඛතා ඇති කොට ගෙන සිටින අංශ විය යුතුයි. බ්‍රිතාන්‍ය පුස්තකාලය 1984 දී ප්‍රතිව්‍යූහයකට භාජනය කරන ලද අවස්ථාවේ දී අනුගත විසඳුම මෙයයි. මෙසේ වූ කල්හි කිසිදු තරඟයක් හෝ ඇනතියක් නො මැති වනු ඇතැයි මින් අදහස් නො කෙරේ. එහෙත් එකම ආයතනයක් තුළ එය සිදුවේ. සහයෝගිතාව සඳහා යෝග්‍ය මෙහෙයුම හා හොඳ හිත ඇති කල්හි එය විනාශකාරී එකක් නොව නිර්මාණාත්මක එකක් විය හැකියි. ඇත්තෙන් ම බ්‍රිතාන්‍ය පුස්තකාලයේ විද්‍යාව, තාක්ෂණය හා කර්මාන්ත අංශයේ පවත්නා ආදායම් ඉපයීමේ විශාල හැකියාව නිසා අනියම් වශයෙන් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා අංශයට උපකාර කරන්නට ඊට හැකි වී තිබේ. මේ අංශ දෙකේම දළ වියදම බෙහෝ දුරට සමානය. (විද්‍යා, තාක්ෂණික හා කර්මාන්ත අංශය පවුම් මිලියන 26.44 යි. ; මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා සඳහා පවුම් මිලියන 25 යි) එහෙත් ඒ දෙකෙහි ශුද්ධ ආදායම එකිනෙකට හාත්පසින් ම වෙනස්ය. (පිළිවෙලින් පවුම් මිලියන 14.3 ක් හා 22.86 ක් වශයෙනි)

ඇතැම් විට ජාතික පුස්තකාලවල ඉතිහාසය හා සම්ප්‍රදාය නිසා දෝ ඒවායින් සමහරක් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ප්‍රකාශන විද්‍යාත්මක හා තාක්ෂණික ප්‍රකාශන වලට වඩා වැදගත් ලෙස සලකන්නට පුරුදු වී සිටී. විද්‍යාත්මක හා තාක්ෂණික සාහිත්‍යයට අයත් බොහෝ දෑ ඉක්මනින් යල් පනින බව ද, ඒවායින් වැඩි හරියක් කුණු කන්දල් බවද, මානව ශාස්ත්‍රීය සාහිත්‍ය විද්‍යාව විසින් සිදු නො කරන ආකාරයෙන් ජාතික සංස්කෘතිය නිරූපනය කරන බව ද, සිය මතයට ආධාරකයන් ලෙස ඔවුහු දක්වති. විවිධ විෂයකට අයත් ''කුණු කන්දල්'' වල ප්‍රතිශතය එතරම් පුළුල් ලෙස වෙනස් වේද යන්න මට සැක සහිත ය. මෙය පිරික්සා බැලීමේ කිසිදු වාස්තවික ක්‍රමයක් ගැන ද මම නො දනිමි. සමාජ විද්‍යාත්මක සාහිත්‍යය ද විද්‍යා හා තාක්ෂණික සාහිත්‍ය තරම් ඉක්මනට යල් පනී. ඇත්තෙන් ම සමාජ විද්‍යාත්මක හා ආර්ථික විද්‍යාත්මක සම්භාව්‍ය ග්‍රන්ථ තිබේ. එහෙත් උද්භිද විද්‍යාව, භූ විද්‍යාව, සත්ව විද්‍යාව වැනි ඇතැම් විද්‍යාත්මක විෂයයන්හි ලා යල් පැන යාම සිදු වන්නේ ඉතා සෙමිනි. ''සංස්කෘතික'' තර්කය ගතහොත් අද අප ජීවත් වන්නේ විද්‍යාත්මක හා තාක්ෂණික සමාජයක ය. මෙය අපේ සංස්කෘතියයි. සැබවින් ම එය ජාතික එකතුව විසින් නියෝජනය කරනු ලැබිය යුතුයි. අවසාන වශයෙන් ගෙන බලන විට අද සමාජ විද්‍යාව බවට පත් වන්නේ ඊයේ කුණු කන්දල් ය. පෙරේද කුණු කන්දල් අද ඉතිහාසය බවට පත් වේ. සංස්කෘතියක් කුණු කන්දල් රැසක් බිහි කරන්නේ නම් එය එසේ වුවා දෙන්. ජාතික එකතුවෙන් ඒ බව පිළිබිඹු විය යුතුය. ජාතික කෞතුකාගාරයක එදිනෙදා බඩු බාහිරාදිය මෙන් ම වටිනා ද්‍රව්‍ය ද රැස් කර තැබෙන්නාක් මෙනි. මධ්‍යගත යුගයේ කසල ගොඩවල් හි මෙන් ම තුතන් කාමන් ගේ සොහොන් ගැබේ අඩු වැඩිය ද එහි තිබිය යුතු යි.

සිය එකතු කුමන පරාසයකට හා ක්ෂේත්‍රයකට අයත් වුවත් ප්‍රමාණවත් සම්පත් රහිත ව ඒවා නඩත්තු කරන්නේ කෙසේද යන්න හැම ජාතික පුස්තකාලයකට ම බලපාන ප්‍රශ්නයකි. ඉහත සඳහන් කළ අයුරු ඇතැම් ඌන සංවර්ධිත රටවල දී විශේෂයෙන් ම අප්‍රිකාවේ දී සමහර ලේඛකයෝ ''විසුරුණු ජාතික පුස්තකාලයක්'' ගැන කථා කරති. මෙය ඇත්ත වශයෙන් ම නීතිමය තැන්පතු ද්‍රව්‍ය ඇතුළු ජාතික එකතුව (කෙසේ අර්ථ නිරූපණය කරනු ලැබුවත්) පුස්තකාල කීපයක් අතරේ බෙදී යාමකි. විශේෂිත ක්ෂේත්‍ර වල දී ප්‍රකාශන රැස් කිරීම අඩු කරලීම හෝ සමහර විට අත් හැර දැමීම පවා කෙතෙක් දුරට කළ හැකි ද යන්න තීරණය කිරීමට මෙහි ප්‍රතිඵල යොදා ගනු ඇත. එහෙත් විද්‍යාව තාක්ෂණික ක්ෂේත්‍ර වල දී එය බොහෝ දුරට කළ හැක්කක් නොවනු ඇත. නමුත් එසේ නො කොට රටෙහි මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ සමස්ත එකතු නඩත්තු කරන්නේ කෙසේ ද

යන්න වටහා ගැනීම අසීරු ය. පෘථුල, ආධිපත්‍යධාරී ජාතික පුස්තකාල වල යුගය ගෙවී ගොස් හමාර ය. එහෙත් පද්ධතියට අයත් ඉතා වැදගත් පුස්තකාලය වීම හා ප්‍රධාන කාර්ය භාරය මෙහෙය වීම යන දෙපසින් ම ජාතික පුස්තකාලය ස්වකීය ප්‍රමුඛතාව රැක ගැනීමට සමත් වනු ඇත. නව-සීලන්තය වැනි කුඩා රටවල දී ''සමස්ත ජාතික සම්පත්'' වඩාත් වැදගත් සංකල්පයක් බවට පත් වීමට ඉඩ තිබේ.

ජාතික පුස්තකාලයට ඉටු කළ හැකි එක් කාර්ය භාරයක් නම් අනෙකුත් පුස්තකාල හෝ ආයතන වලට කළ නො හැකි නැතහොත් කිරීමට උවමනාවක් නැති අවශේෂ කාර්යයන් ඉටු කිරීමයි. එබඳු ජාතික පුස්තකාලයක එකතුව බෙහෝ දුරට කිසිවකුට අවශ්‍ය නො වන නිසා අනෙකුත් පුස්තකාල විසින් එකතු කරනු නො ලබන ද්‍රව්‍ය වලින් සමන්විත වනු ඇත. එබඳු සේවාවන් වෙතොත් ඒවා කිසිඳු වාණිජමය ආයතනයක් විසින් අත නො ගැසූ වර්ගයේ ඒවා වනු ඇත. මෙය සිංහයන් විසින් ඉතිරි කර දමන ලද මස් කැබලි අවුලන හයනා දිවියකු ගේ කාර්යයට සමාන ය, ඌ ලඳු කැලය පවිත්‍ර කරයි. එහෙත් එය ප්‍රධාන කාර්යයක් නොවේ. අතිරේකයක් පමණි.

සැබවින්ම දැන් ජාතික පුස්තකාල වල කාර්ය භාරය හා කටයුතු පිළිබඳ අදහස් වල ස්වභාවය වෙනස් වෙමින් පවතී. ජාතික පුස්තකාලයක කටයුතු ඉටු කිරීම ගැන කතා කරන්නට අපි පටන් ගෙන සිටිමු. එනම් ඉටුවිය යුතු පුස්තකාල කටයුතු ජාතික මට්ටමින් ඉටු කිරීම ගැන ය. නීතිමය තැන්පතුව, ජාතියේ ප්‍රකාශන වල ග්‍රන්ථ විද්‍යාත්මක පාලනය, සංරක්ෂණය, ප්‍රලේඛන සැපයීම ආදී කාර්යයන් ගෙන බලන්නේ නම් ඒ එකිනෙක ඉටු කිරීම සඳහා වන විකල්ප මාර්ග වටහා ගැනීමටත්, එකිනෙක සඳහා වඩාත් උචිත විකල්පය තීරණය කිරීමටත් හැකි වනු ඇත. ඇත්තෙන් මෙය සමස්ත ව්‍යාපෘතියක් ලෙස කළ යුක්තකි. නො එසේ නම් පොදු විසඳුමක් වෙනුවට එකිනෙකට නො ගැළපෙන විවිධාකාර විසඳුම් ඉදිරිපත් වීමට ඉඩ ඇත. නිදසුනක් ලෙස ගතහොත් සමස්ත ජාතික සම්පත් එකතුව නඩත්තු කිරීමේ හොඳම මාර්ගය වන්නේ එක් ජාතික, පුස්තකාලයක් පවත්වා ගැනීම මගින් යැයි තීරණය කරන ලද්දේ නම්, එසේම හොඳම මාර්ගය සහයෝගිතා ක්‍රම බව ද තීරණය කර තිබේ නම් ඒ දෙකම ඉටු කිරීම සමහර විට නුසුදුසු වනු ඇත. මක්නිසාද යත් ජාතික එකතුවක් නිසිලෙස සංවිධානය කරන ලද්දේ නම් එය කාර්යක්ෂම ජාතික ප්‍රලේඛන පද්ධතියක් බවට පත් වියහැකි හෙයිනි. ජාතික පුස්තකාල සැලසුම් කිරීමේ ඊළඟ පියවර විය යුත්තේ එමගින් ඉටු කළ යුතු යැයි දක්වනු ලබන විවිධාකාර කාර්ය භාරයක් නිරීක්ෂණය කොට, සමහර විට ඒවාට වෙනත් කාර්යයන් ද එකතු කොට, ඒවා වඩාත් හොඳින් ඉටු කළ හැක්කේ කෙසේ දැයි විශ්ලේෂණය කොට බැලීමයි. පිළිතුරු රටින් රටට වෙනස් වනු ඇත. එහෙත් මේ එළඹුම හැම රටකටම වලංගු එකක් වනු නිසැක ය. මේ කාර්යය ඉටු කිරීමේ දී පවත්නා ක්‍රමයේ ප්‍රබලතා මෙන් ම දුබලතා ද සිහි තබා ගත යුතුය. එසේ ම කිසි කලක සාක්ෂාත් කර ගත නොහෙන ''පරමාදර්ශී'' ක්‍රමයක් සැළසුම් කිරීම වෙනුවට ආර්ථික හා ප්‍රායෝගික යථාර්ථයන් කෙරෙහි ද අවධානය යොමු කළ යුතු වේ.

ජාතික පුස්තකාල කාර්යයන් පිළිබඳ ප්‍රමුඛතා ද ප්‍රමාණය විසින් මතු නොව වැදගත්කම අතින් ද රටින් රට වෙනස් වනු ඇත. නිදසුන් ලෙස ගතහොත් ජාතික ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තාව සකස් කිරීම ඌන සංවර්ධිත කුඩා රටක දී වැදගත් එහෙත් ඉතා කුඩා කාර්යයකි. එහෙත් ජාතික පුස්තකාල පද්ධතියේ නායකත්වය දැරීම හා ඊට අවශ්‍ය පුද්ගලයන් පුහුණු කිරීම ආදිය වැදගත් මෙන්ම ප්‍රධාන කාර්යයන් ලෙස ද සැළකිය යුතුය. ඇත්තෙන් ම සාම්ප්‍රදායික ජාතික පුස්තකාල යකින් තොරව අප්‍රිකානු රටවලට කටයුතු කළ හැකිද, නැතහොත් ඒ වෙනුවට නීතිමය තැන්පතුව (රාජ්‍ය ලේඛණාගාරයක මෙන්), ජාතික ග්‍රන්ථ විද්‍යාත්මක වාර්තාව සම්පාදනය කිරීම, ජාතියේ පුස්තකාල සැලසුම්, ජාතික ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්තිය හා අනෙක් රටවල් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කිරීම ආදී කටයුතු වලට වගකිව යුතු වෙනත් ඒකකයක් තිබිය යුතුද යන්න පැහැදිලි කිරීමට මෙබඳු විග්‍රහයක් උපකාරී වනු ඇත. සාමාන්‍ය යෙන් පිළිගත් වචනාර්ථයෙන් බැලූ විට නම්, මෙවැන්නක් ජාතික පුස්තකාලයක් නො වනු ඇත. එහි එකතුව ඉතා කුඩා එකක් විය හැකියි. එහෙත් එය වඩාත් මධ්‍යම ඒකකයක් හා කේන්ද්‍රයක් වනු ඇත.

ජාතික පුස්තකාල සඳහා පොදුවේ පිළිගත් කාර්යයන් හා ප්‍රමිත නියමු මං සංස්ථාපනය කිරීමට ගන්නා ලද විවිධ ප්‍රයත්න සමහර විට සුදුසු තන්හි නො පිහිටි ඒවා ය. සියලුම රටවලට පොදුවේ ආරෝපණය කළ හැකි එක් නිදර්ශනයක් නැත. ජාතික පුස්තකාල අනෙකුත් වර්ගවල පුස්තකාල වලට වඩා වෙනස් ය. වෙනස් විය යුතුය. ඒවා ජාතික සංස්කෘතිය පිළිබිඹු කළ යුතු අතර සිය රටවල අවශ්‍යතා වලට සම්බන්ධ විය යුතුය. සමහර පැරණි ජාතික පුස්තකාල ඒවා පිහිටුවන ලද අවස්ථාවේ දී මෙසේ කටයුතු කරන ලදී. අනෙක්වා පෞද්ගලික, බොහෝ විට රාජකීය එකතු පැදනම් කොට ගෙන ගොඩ නැගුණි. මේවාට අනෙකුත් ජාතික පුස්තකාලවලට මෙන් ම ඒවායේ ස්වභාවයන් හා කාර්යයන් ගැන යළි සලකා බැලීමට සිදු වියහැකිය. සමහරවිට ජාතික පුස්තකාලයක් යනු ඇතැම් ජාතික කට යුතු ඉටු කරන සාමාන්‍ය පුස්තකාලයකට වඩා වැඩි මනත් එකක් නොවේ.

ජාතික පුස්තකාලයක් නැති රට අසම්පූර්ණ යැයි පොදු අදහසක් ඇති බව මම ආරම්භයේ දී සඳහන් කළෙමි. එහෙත් සම්හර රටවල ජාතික පුස්තකාල නොමැති බවත්, සම්හර විට කිසිදාක බිහි නො වනු ඇති බවත් අපට දක්නට ලැබුනි. අවසන් වී ඇතැයි සිතූ සංවාදයක් දැන් ඇතැම් රටවල හට ගනිමින් තිබේ. ජාතික පුස්තකාල ස්ථිරසාර ආයතන යැයි අපට සිතීමට පවා නො හැකිය. සමහර ජාතික පුස්තකාල වල ප්‍රධාන කොටස් ගිලිහී ගොස් ඇත. (නවසීලන්තයේ General Assembly පුස්තකාලයේ මෙන් ඕස්ට්‍රේලියාවේ ද දෘශ්‍ය ලේඛනාගාර දැන් වෙන් වී ඇත.) එක් රටක එක් අවස්ථාවක දී ජාතික පුස්තකාලය වසා දැමීමේ තර්ජනයකට පවා ලක් විය. (පැපුවා නිව්ගිනියාවේ දී) ''සම්පත් බෙදා හදා ගැනීම'' යන සම්භාවනීය සාධකයකට මුවා වී සහවා ගනු ලැබූවත් අනෙකුත් ජාතික පුස්තකාල ද හැකිලී යන බවත් පෙනේ; කුඩාම් ජාතික පුස්තකාල ඇති රටවල මේ සංවාදය දැන් බලවත් වී ඇත. එහෙත් මැනවින් සංස්ථාපිත විශාල ජාතික පුස්තකාල ඇති රටවල පවා මේ සංවාදය ප්‍රමාණයෙන් මෙන් ම තීව්‍රතාවෙන් ද වැඩෙනු ඇතැයි මට අනාවැකි පළ කළ හැකි ය.

(15 වැනි පිටුව බලන්න)

# ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ග්‍රන්ථ සංවර්ධන ව්‍යාපෘතියේ අනුග්‍රහයෙන් පහත සඳහන් කෘතීන් 1989 පෙබරවාරි මස සිට ජූනි දක්වා පළ කර ඇත.

**සමාජ විද්‍යාව**
ජී. එස්. බී. සේනානායක — 1915 යුද්ධ නීතිය යටතේ ලංකාව

**විද්‍යාව**
Dr. I. S. M. Fernando — Living with Diabetes

**සිනමාව**
ආතර් යූ. අමරසේන — සිංහල සිනමා වංශය

**සාහිත්‍යය**
ආචාර්ය කුලතිලක කුමාරසිංහ — හේමපාල මුනිදසගේ කෙටිකතා.

**නවකතා**
ටී. බී. ඉලංගරත්න — දරුවෝ සහ නො දරුවෝ

**පරිවර්තන කෘති (කෙටි කතා)**
සුගුණපාල සමරසේකර (Rabindranath Tagore) — තාගෝර් නිර්මාණ (Collected Poems & Plays of Rabindranath Tagore)

**චරිත කථා**
තෙරිපැහැ සෝමානන්ද හිමි — විදුරපොළ පියතිස්ස මා හිමි

ආනන්ද ඩබ්. පී. ගුරුගේ — මා වැනි බිලින්ද

**Poems**
Alfreda de Silva — The Unpredictable Blood

ඉහත සඳහන් සියලුම කෘති වෙළඳ වට්ටම් යටතේ මහජන පුස්තකාල, පාසැල් පුස්තකාල, දෙපාර්තමේන්තු පුස්තකාල හා සුභ සාධක පුස්තකාල සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් මිල දී ගත හැක.

# THE PROVINCIAL COUNCILS SYSTEM & THE FUTURE ORGANISATION OF LIBRARY SERVICES IN SRI LANKA

Along with the recent introduction of the Provincial Councils system a considerable transformation took place in the general administration system and local government in Sri Lanka. Instead of the centralized system that existed this for, decentralized administration system was brought into operation.

Local government in this island has been a field that had undergone various changes during the past several decades. Up to 1981, there existed a system of local government under such authorities as Village Councils, Town Councils, Urban Councils and Municipal Councils. In 1981 the Development Councils System was introduced with the aim of decentralizing local government still further. The Village Councils and Town Councils that were at the bottom level of the old system of local government were replaced with Development Councils.

Sri Lanka, whatever local government system existed, general administration of the country was conducted in quite a different way since the very beginning. During the time of the British occupation, what existed was a system of provincial rule. After independence, the general administration was conducted mainly on a District basis. Although no Local Government Authority existed at District Level, the entire Administration was conducted by the central government at District level. The Government Agent and other officials conducted the administration. In 1974, with the adoption of decentralized budget, an important change in the District level administration took place. It introduced for the first time the responsibility not only for the implementation but also for the preparation of plans at regional level. Accordingly a system of local government at several levels and a system of general administration at District level came to be a common feature in Sr iLanka until recent times.

We are aware that the main basis for the introduction of Provincial Councils was the need to grant a considerable level of self determination in regard to the affairs of the people of various multi-racial areas. The failure to decentralize sufficient powers through the Development Councils system introduced in 1981 and the Pradeshiya Mandalas and Gramodaya Mandalas set up to fit with the above was mentioned as one of the primary reasons that influenced the creation of the Provincial Councils system. Accordingly, the new system had to be a local government unit with more powers that were enjoyed by Development Councils.

Under the Provincial Councils system, the main powers fall into 03 categories.

a. **Powers of the central government**
b. **Powers of the Provincial Councils**
c. **Powers to be jointly implemented by the Central government and the Provincial Council.**

There is a difference seen at first sight between the powers by the previous Development Councils and those enjoyed by the provincial Councils. Under the Development Councils system total powers over 15 subjects were devolved on Development Councils. Though these powers were quite extensive, a main weakness was that these Council's had to depend largely on the central government for the funds required for the implementation of those powers. Experience gathered during the past few years showed that the mere granting of powers without direct financial, provisions does not mean that those powers can be duly implemented without any difficulty.

An examination of the Provincial Councils Act shows that a fair attempt has been made to remove this weakness from the Provincial Councils system. The Provincial Councils Act provides for a number of funding overseers for the proper working of the Councils. There are few main avenues of funding for Provincial Councils.

a. **Taxation within the Province**
b. **Taxes levied jointly by the Central Government and the Provincial Council.**
c. **Financial allocations from the Central Government.**
d. **Foreign aid and other foreign financial assistance.**

According to the Act a permanent Finance Commission has to be appointed to clarify matters relating to joint taxation by the Central Government and the Provincial, Councils.

With this new Provincial Councils system in force, extensive changes can be expected in the field of Local Government Libraries. The existence of a single authority for an area where previously several local government authorities existed would be most helpful in extending the Library Service over new paths.

The creation of District Libraries in 1981 by the Sri Lanka National Library Services Board can be described as the first attempt made to free the local Public Library Service from traditionalism. The attempt was aimed at centralizing at District level the poor library service that remained decentralized at a host of small Local government institutions. While a Central District Library was named for each District an attempt was made to use it as the Mother Library to develop the library service at District level. The financial problem that weakened the District Development Councils system also became one main reason to weaken the District Library Service. Another shortcoming was the absence of a Local Government Authority at District level. Hence, the District Central Library had to work in association with other small Local Authorities that had limited powers. Therefore, the limited success of District Libraries can be attributed to their lack of peımanent financial and legal bases.

Under the new Provincial councils system both these weaknesses seem to have disappeared. The defini establishment of Provincial Councils and the devolution of wide and definite powers to them by the Provincial Councils Act have given these Councils a strong legal foundation. The constitutional and executive powers of a Provincial Council consisting of members elected from each area, a Chief Minister and a Cabinet selected by the members and a Governor appointed by the President are clearly set down. Further, as a result of the financial provisions and financial authority granted to them the Provincial Councils have the capacity to implement their powers properly. In this background a new library system created in association with the Provincial Councils would show clear signs of success.

What is important here is the type of library service that need be established in each area. In the powers developed on Provincial, councils, there is no special stipulation in regard to the maintenance of library services. Even so, in view of the fact that Provincial Councils enjoy wide powers in the matter of education, culture and local government in their areas of authority, it is clear that a Provincial Council has the capacity to organise a useful and healthy library service. Each Province comprises several Districts, mostly three. Therefore, District Libraries can be maintained further with greater stability. In addition to District Libraries, the new system provides an opportunity even to have a Central Regional Library catering to the entire Province.

This Central Library could also serve as a small National Library for the area. Such a Library should serve as the Mother Library for the entire Library field and not merely for the Public Libraries. As financial provision can be obtained directly from the Provincial Councils the maintenance of such a library will not be difficult. It will be connected to the National Library of Sri Lanka at National level and to the District Library and other libraries area-wise.

The structure of the Provincial Council Library field headed by the Regional Library can be shown as follows :

The responsibilities and functions of a Regional Library can be considered under several main sections. What is here meant by a Regional Library is the Regional Library and the relevant institution of authority appointed by the Provincial Council for the management of the library.

The main responsibility of the Regional Library is to maintain a large collection of books and other library material, as it is the leading library of the area. In this way it would provide readers with library facilities of a high level, while at the same time it could serve as a central library providing all necessary extra resources to other libraries of the area. This dual responsibility of serving both readers and libraries can be shown as a special feature of a Regional Library.

It would be emphasized here that the Regional Library is not the main Public Library of the Province. While it should be the centre for all types of library services it should for that same reason be in the form of a small national library.

Accordingly, it should be the responsibility of a Regional Library to serve as the Central Library for the Public Libraries of the Province as well as for school libraries, Departmental Libraries, Libraries of technical institutions Pirivena Libraries, Special Libraries, Libraries of Voluntary Organisations, Libraries of Universities and other higher educational institutions and temple libraries etc.

Being the central library for all library services, the Regional Library and the Regional Library Authority will have a host of responsibilities. One of the chief benefits this would bring is the possibility of planning properly the library services of the Province. Up to now the various aspects of Library Services as well as various libraries of one particular field had to be conducted in isolation.

This was one of the main obstacles that stood in the way of improving the library field.

The Regional Library and the Provincial Council can formulate a comprehensive library plan covering the entire library field so that the above situation can be averted and library service developed. This would pave the way to make maximum use of all resources that could be utilized for the benefit of libraries and to obtain maximum results through various library support system.

With the Regional Library serving a geographically small area and that area becoming organised as sub-divisions under District libraries it will be easy to plan and implement new organisational work in the library field. It will also be possible to organise a separate library network for the various District libraries and a subsidiary library network for the various subject fields, with the Regional Library as their centre, in addition to the general library network covering all libraries of the area. The Kandy District pilot library scheme implemented by the Sri Lanka National Library Services Board with UNESCO assistance (1972-1976) is the best example showing how library services can be speeded up by limiting the task to a given geographical area. This characteristic was also observed, quite clearly in the Central Library movement implemented by the Education Ministry (1969-) and District Central Library Scheme implemented by the Sri Lanka National Library Services Board and the Local Government Ministry (1982-) despite their various shortcomings.

If any planned programmes are properly implemented with Regional Libraries at this centre in all Provinces of the island it would be a new turn in library development in this country. As Library Scientists we are all aware of the benefits that are being brought to library services by combined planned activities. By assigning one or several libraries with the task of obtaining the relevant books for each subject field jointly, the reading public of a Province would be able to get a considerable quantity of library material. In such circumstances it would be easy to start a good inter-library reference service within the Province under the initiative of the Regional Library. The Maintenance of libraries under various controlling institutions, geographical disparities, absence of a common library plan and such other obstacles that prevent the inauguration of inter-library reference service will cease to assist. In this regard it will be a major task of the Regional Library to prepare an Integrated Regional Index relating to resources available in the libraries of the area.

A programme most successfully carried on in a number of small North-European countries is the purchasing of books from some centre or other, completing the technical services required and distributing them thereafter. At present, the Ministry of Educational Services and the Ministry of Local Government do a centralized purchasing of books for School libraries and Public libraries respectively to a limited extent in Sri Lanka. It would appear timely for Regional Libraries to start a centralized purchasing system on behalf of libraries in their respective areas. While book publishers would offer a good discount on bulk purchases, the libraries too would in turn be able to buy their books at reduced prices. Further, a centralized form of purchasing would facilitate a planned method of purchasing of required books by each library for various subjects as envisaged above. It would be of immense convenience to other libraries if the Regional Library would also undertake at the same time such tasks as book binding, laminating and providing of book pockets, date labels, issue cards and other technical services. In addition to these technical services the preparation of Index cards can also be centrally done. This would ensure correct and inform indexing in other small libraries of the Province. This would also help prepare the Regional Intergated Index easily and thereby help the National Library to prepare the National Integrated Index easily.

**IT WOULD BE EMPHASIZED HERE THAT THE REGIONAL LIBRARY IS NOT THE MAIN PUBLIC LIBRARY OF THE PROVINCE. WHILE IT SHOULD BE THE CENTRE FOR ALL TYPES OF LIBRARY SERVICES IT SHOULD FOR THAT SAME REASON BE IN THE FORM OF A SMALL NATIONAL LIBRARY.**

If a centralized purchasing system is adopted by Regional Libraries, one need not speak of the advantage it would bring to the local book production field. Further, it is well known how the Sri Lanka National Library Services Board has rejuvenated the local publication industry during the past few years by purchasing more or less a thousand copies of each publication. If nine decentıalized institutions were to purchase books in this manner the service that can be rendered to the local publishing field can be considerable.

There are also a host of services essential for a library service which for various economic and practical reasons a small library cannot afford to provide. These services can be undertaken by the Regional Libraries. One example is the maintenance of a Library Conservation and Restoration Centre. Such a centre could scientifically, and economically feasible manner carry out the conservation and

restoration of books and other equipment of libraries within the Province. An example of a successful implementation of such a Programme is the book-binding project that is being conducted by the D. S. Senanayake Memorial Library in Kandy. As these projects provide new employment opportunities, it need not be specially mentioned that they will be particularly appreciated by the Provincial Council.

Production of library furniture is another project that can be centrally undertaken. Though there are about 7000 libraries in the country, no institution has still started a project for the production of furniture according to standards required by libraries. If a Regional Library would undertake this project in an area where timber is easily available, it will not only fulfil a professional requirement in the library field, but will also turn out to be a profitable financial investment.

While the National Library Service remains under the Central Government, the decntralization of the library service in various areas under the Provincial Councils can be fruitfully organised in this manner. In most countries where decentralised or semi decentralized forms of administration exist, library services in various areas are well organised under Regional Libraries. Many of the problems now facing local libraries and the field of communication services can be solved by this way.

